Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

**විෂය- පෙරදිග සංගීතය** | **සතිය- 01**

**12 ශ්‍රේණිය** | **සැකසුම-එම්.ඩී.එල්.පී.වික්‍රමසිංහ**

**නිපුණතාව- 1.0** **නිපුණතා මට්ටම- 1.1**

**පාඩම- ස්වර අභ්‍යාස,හඬ පාලනය හා ගායන වාදන ඉරියව්**

**ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා වඩාත් නිවැරදි වරණය තෝරන්න.**

01. සංගීතය හදාරන ආධුනිකයෙකු වඩාත් ප්‍රගුණ කළ යුතු වන්නේ

1) රාගාලාපයයි 2) ස්වර අභ්‍යාසයයි 3) සර්ගම් ගීතයයි 4) ලක්ෂණ ගීතයයි 5) මුඛ්‍යාංගයයි

02. "රිගසරි" යනුවෙන් ආරෝහණය ආරම්භවන ස්වර අභ්‍යාසයක අවරෝහණය ආරම්භ කිරීමට සුදුසු ස්වර ඛණ්ඩය වන්නේ

1) රි̊ස̊ග̊රි̊ 2) රි̊ග̊ස̊රි̊ 3) ස̊රි̊නිධ 4) ස̊ධනිස̊ 5) නිධස̊නි

03. මානසික ඒකාග්‍රතාවයකින් යුතුව හුස්ම හැසිරවීම ප්‍රගුණ කිරීම සඳහා වඩාත් උචිත ක්‍රියාකාරකමක් වන්නේ

1) ආනාපානසති භාවනාවේ යෙදීම

2) උඩට මුදාහල පුළුන් කැබැල්ලක් නැවත නැවත පිඹිමින් ඉහළම රඳවා ගැනීම

3) දැල්වූ ඉටිපන්දම් දැල්ලට නොනිමෙන සේ ඒකාකාරීව චලනය වන අයුරින් පිඹීම

4) බුද්ධ ස්තෝත්‍රයේ වැඩි කොටසක් එක් හුස්මට නොනවත්වා ගැයීම

5) ශ්‍රැතිය මත පිහිටා ඕම් අක්ෂරය ගැයීම

04. හඬ පාලනය හා භාව නිරූපණය වඩාත් ඉස්මතු වී පෙනෙන නාට්‍ය ගීතයකි

1) සෝබාව දේ මෙපුර 2) යස ඉසුරු පිරුණු තැනා 3) දීකිරි දීකිරි
4) ගල්ලෙන බිඳලා 5) සුවඳ සබන් ඇඟ ගාලා

05. දත්මිටිකමින් හෝ දත් නියවමින් ගී ගැයීමේ දෝෂය හඳුන්වන්නේ කුමන නමකින් ද?

1) සංදෂ්ටය 2) උද්ඝෘෂ්ට 3) ශීත්කාරී 4) උද්වඩ 5) විරස

**ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා හිස්තැන්වලට ගැළපෙන පිළිතුරු යොදා සම්පූර්ණ කරන්න.**

06. පාදක ශ්‍රැති ස්වරයේ සිට මන්ද්‍ර ...................... ස්වරය දක්වාත් උච්ච ........................... ස්වරය දක්වාත් ගැයීමට ඇති හැකියාව පෙරදිග සංගීතයේදී වැදගත් වේ.

07. "මරිගප" යන ස්වර අභ්‍යාස ඛණ්ඩයට පෙර යෙදිය යුතු ස්වර ඛණ්ඩය ........................ වන අතර පසුව යෙදිය යුතු ස්වර ඛණ්ඩය ............................ වේ.

08. එම්. ජී. පෙරේරා සූරීන් විසින් ර. ත ……………………………..  ග්‍රන්ථයේ ගායන දෝෂ ……… පමණ දක්වා ඇත.

09. ශ්‍රැතියෙන් අඩුව හෝ වැඩිව ගී ගැයීම …………………….……..  දෝෂය වන අතර තාලයෙන් තොරව ගී ගැයීම ……………………………..  නම් දෝෂය යි.

10. ශාස්ත්‍රීය ගායනයක දී අසුන් ගැනීමට සුදුසුම ඉරියව්ව ……………………….. වන අතර සප්තක තුනම එකසේ හැසිරවිය හැකි භාරතීය ශාස්ත්‍රීය ගායන ශිල්පිනියක ලෙස ……………………......... හැඳින්විය හැකිය.

**දෙවන කොටස**

01. පහත දැක්වෙන ස්වර ඛණ්ඩවලින් ආරම්භවන ස්වර අභ්‍යාස,ආරෝහණ අවරෝහණ වශයෙන් ගොඩනගන්න.

- සගරිග
- ගරිසග
- රිසසරි
- සමගරි

02. ගායකයෙකුට හඬ පාලනය වැදගත්වන අවස්ථා හතරක් සඳහන් කරන්න.

03. ශරීරය තුළ ඇති චක්‍ර අවදි කොට කුණ්ඩලනී ශක්තිය ලබා ගැනීම සඳහා සංගීතය මාර්ගයක් වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

04. ප්‍රාසංගික ඉදිරිපත් කිරීමකට සූදානම්වන ඔබේ මිතුරෙකුට ගායන දෝෂ මගහැර, ගායන ගුණ වර්ධනය කර ගනිමින් හා නිවැරදි ඉරියව්වෙන් ඉදිරිපත් කිරීම කළ යුතු ආකාරය දැක්වෙන උපදෙස් පත්‍රිකාවක් සකස් කරන්න.